සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, Year End Test, July 2019**

**ආර්ථික විද්‍යාව - I**
**Economics - I**

21 S I

පැය 02 යි.
Two hours

විභාග අංකය : ......................................

* උපදෙස්
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
* අංක 1 සිට 50 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

01. ආර්ථික විද්‍යාවේ හිඟකම කේන්ද්‍රීය ගැටලුව වෙයි. මෙම ගැටලුව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   1. ආර්ථික වෘද්ධිය තුලින් විසඳා ගත හැකි ගැටලුවකි.
   2. සංවර්ධනය වන රටවලට පමණක් අදාල වූ ගැටලුවකි.
   3. ඇතැම් භාණ්ඩවල හිඟයක් තිබෙන බව අදහස් කෙරෙන ගැටලුවකි.
   4. මිනිස් වුවමනා අසීමිතව තිබෙන තෙක් පවතින ගැටලුවකි.
   5. සම්පත් පිරිමැස්මෙන් භාවිතා කිරීමෙන් විසඳාගත හැකි ගැටලුවකි. (..........)

02. පහත සඳහන් ප්‍රකාශ අතුරින් සූක්ෂම ආර්ථික විද්‍යාවට අයත් යථානුරූපී ප්‍රකාශය කුමක් ද?
   1. භාණ්ඩයේ මිල ඉහළ යන විට සැපයුම් ප්‍රමාණය වැඩිවෙයි.
   2. ශ්‍රී ලංකාවේ තිබෙන ගැටලුවක් නම් අධ්‍යාපනය ලබන තරමට විරැකියාවෙන් සිටීමේ අවධානම වැඩිවීමයි.
   3. ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතය අඩු වීම ආර්ථිකයට හිතකර වේ.
   4. ආර්ථිකයේ සමස්ත වියදම අඩුවනවිට මිල මට්ටමද පහත වැටෙයි.
   5. මුදල් සැපයුම වැඩිවීම පොලී අනුපාතය අඩුවීමට හේතු වෙයි. (..........)

03. ආර්ථික පසුබැසීමක් (Recession) හා ආර්ථික අවපාතයක් /පරිහානියක් (Depression) සම්බන්ධ පහත ප්‍රකාශවලින් වැරදි ප්‍රකාශය හඳුනාගන්න.
   1. ආර්ථික පසුබැසීම කෙටිකාලීන මුර්ත නිමවුමේ අඩුවීමකි.
   2. ආර්ථික පසුබැසීමට හේතුව සමස්ත වියදමේ ඌණතාවයකි.
   3. ආර්ථික පසුබැසීමකදී නිමවුම් පරතරය ඍණ අගයකි.
   4. ආර්ථික පසුබැසීමකදී නිෂ්පාදන හැකියාව අඩුවෙයි.
   5. ආර්ථික අවපාතයකදී මුර්ත නිමවුම දිගුකාලීනව සංකෝචනය වන අතර ප්‍රාග්ධන වත්කම් ක්ෂය වීමෙන් විභව නිමවුමද අඩුවිය හැකිය. (..........)

04. පහත සඳහන් ප්‍රකාශවලින් සමාජයීය වෙළෙඳපොළ ආර්ථික පද්ධතිවලට අදාළ ප්‍රකාශය කුමක් ද?
   1. දේපළ අයිතිය රජය සතුවන මූලික ආර්ථික ප්‍රශ්න යම් ප්‍රමාණයකට මිල යන්ත්‍රණයෙන් විසඳා ගනු ලබන ආර්ථික පද්ධතියකි.
   2. වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය සමඟ සමාජ සාධාරණත්වය හා පෞද්ගලික නිදහස ඒකාබද්ධ කොටගත් ආර්ථික පද්ධතියකි.
   3. සම්පත් බෙදා හැරීමේ යන්ත්‍රණය මිල ක්‍රමය මත පදනම් වූ ආර්ථික පද්ධතියකි.
   4. දේශපාලන දර්ශන හා දෘෂ්ටිවාද පදනම් කරගත් ආර්ථික පද්ධතියකි.
   5. පෞද්ගලික අංශය වෙළෙඳපොළ යන්ත්‍රණය මගින් සහ රාජ්‍ය අංශය සැලසුම් යාන්ත්‍රණය මගින් සම්පත් බෙදාහරින ආර්ථික පද්ධතියකි.

(..........)

05. කිසියම් ආර්ථික කටයුත්තක ආවස්ථික පිරිවැය සම්බන්ධව පහත ප්‍රකාශ අතුරින් එකග විය හැකි ප්‍රකාශය වනුයේ කුමක් ද?
1. ආවස්ථික පිරිවැය සියලු දෙනාටම සමානවෙයි.
2. ආර්ථික කටයුත්තෙහි ආරෝපිත පිරිවැය පමණක් අදාලවෙයි.
3. ආවස්ථික පිරිවැය ගණනයේ දී කැප කරන ලද මූල්‍ය පිරිවැය පමණක් අදාල වෙයි.
4. ආවස්ථික පිරිවැය ගණනයේ දී මූල්‍ය පිරිවැය සහ ආරෝපිත පිරිවැය යන දෙකම අදාල වෙයි.
5. ආර්ථික කටයුත්තක ආරෝපිත පිරිවැය පමණක් අදාලවෙයි. (..........)

06. මානව ප්‍රාග්ධනය ආර්ථික වෘද්ධියට ඉතා වැදගත් සාධකයක් ලෙස දැක්වෙයි. ඒ අනුව මානව ප්‍රාග්ධනය ලෙස සැලකෙනුයේ කුමක් ද?
1. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගනු ලබන ශ්‍රමයයි.
2. ආර්ථිකයේ අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා වෙනුවෙන් දරන ආයෝජනයයි.
3. ශ්‍රමයේ ඵලදායිතාව ඉහළ නැංවීමට හේතුවන කුසලතා වෙයි.
4. අධි තාක්ෂණික වෘත්තීන්වල නියුක්ත ශ්‍රම හමුදාව වෙයි.
5. ශ්‍රමිකයා ලබාගෙන තිබෙන දැනුමයි. (..........)

07. මධ්‍යගත සැලසුම් ආර්ථික පද්ධතියක වාසියක් ලෙස සැලකිය හැක්කේ කුමක් ද?
1. ප්‍රාග්ධනය සහ ශ්‍රමය සමාන ලෙස භාවිතා කිරීමයි.
2. නිෂ්පාදන කටයුතු පාරිභෝගික වරණය අනුව සිදුවීමයි.
3. තීරණ ගැනීමේ දී පෞද්ගලික පිරිවැය හා පෞද්ගලික ප්‍රතිලාභ මත නොව සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ පදනම් කර ගැනීමයි.
4. පාරිභෝගිකයින්ට ස්වාධිපත්‍යයක් පැවතීමයි.
5. රජය ආර්ථික කටයුතුවලට අවම ලෙස මැදිහත් වෙමින් කටයුතු කිරීමයි. (..........)

08. පහත දැක්වෙන දේ අතුරෙන් ආර්ථික භාණ්ඩයක ලක්ෂණයක් නිවැරදිව පිළිඹිබු කරන පිළිතුර ඇතුළත් බාණ්ඩය කුමක් ද?
A - සම්පත් පිරිවැයක් පැවතීමයි.
B - ආවස්ථික පිරිවැයක් පැවතීමයි
C - පාරිභෝගිකයා මිලක්ද ගෙවීමයි.
D - හිඟකමක් නොපැවතීමයි.


1. A හා B ය  2. A හා C ය  3. B හා D ය  4. A , B සහ C ය.  5. B, C සහ D ය.

(..........)

09. වෙළෙඳපොළ ඉල්ලුම තීරණය වීමට මෙන්ම ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීමටද බලපාන සාධකය කුමක් ද?
1. සලකා බලන භාණ්ඩයේ මිල වෙනස්වීම
2. අනුපූරක භාණ්ඩයක මිල වෙනස්වීම
3. පාරිභෝගික අදායම වෙනස්වීම
4. පාරිභෝගික රුචිය වෙනස්වීම
5. ගැනුම්කරුවන් සංඛ්‍යාව වෙනස්වීම (..........)

10. එක්තරා භාණ්ඩයක මිල රුපියල් 10 දී පාරිභෝගික පැහැදම රුපියල් 2000 ක් වන අතර මිල රුපියල් 20 දී පාරිභෝගික පැහැදම රුපියල් 3500 ක් විය. මෙම භාණ්ඩය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. භාණ්ඩයේ මිල වෙනස්වුවද ඉල්ලුම් ප්‍රමාණය නොවෙනස්ව පවතින බවයි.
2. භාණ්ඩයේ මිල වෙනස්වන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වන බවයි.
3. භාණ්ඩයේ මිල වෙනස්වන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වන බවයි.
4. භාණ්ඩයේ මිල වෙනස්වන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයක දී ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වන බවයි.
5. භාණ්ඩයේ මිල සුළු ප්‍රතිශතයකින් වෙනස්වන විට ඉල්ලුම ප්‍රමාණය විශාල ප්‍රතිශතයකින් වෙනස්වන බවයි.
(..........)

11. එක්තරා භාණ්ඩයකට අදාළ වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය මතු දැක්වේ.




මෙම ඉල්ලුම් වක්‍රයේ මිල රුපියල් 20 ට අදාල මිල ඉල්ලුම් නම්‍යතාවය වන්නේ,
1. - 5.0 කි  2. - 0.5 කි
3. - 2.0 කි  4. - 0.2 කි
5. - 1.0 කි
(..........)

12. හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් ගනීනම් එවැනි භාණ්ඩ,

1. ආදේශන භාණ්ඩ වේ.
2. අනුපූරක භාණ්ඩ වේ.
3. සාමාන්‍ය භාණ්ඩ වේ
4. බාල භාණ්ඩ වේ.
5. ගිෆන් භාණ්ඩ වේ. (..........)

13. භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කෙරෙන සාධකයක් වන්නේ,

1. පාරිභෝගික ආදායම
2. ආදේශක සංඛ්‍යාව
3. එම භාණ්ඩයේ මිල
4. අනාගතය පිළිබඳ අපේක්ෂාවන්
5. රජයේ ප්‍රතිපත්ති (..........)

14. තරගකාරී වෙළෙඳපොලක අලෙවිවන භාණ්ඩයක සැපයුම් වක්‍රය වමට ගමන් කිරීමට බලපාන සාධකයකි.

1. සම්බන්ධිත භාණ්ඩ මිල අඩුවීම.
2. අනාගතයේ මිල අඩුවෙතැයි නිෂ්පාදකයන් අපේක්ෂා කිරීම.
3. රජය නිෂ්පාදකයින්ගෙන් අයකරන බදු කපාහැරීම.
4. නිෂ්පාදනයට යොදාගන්නා යෙදවුම් මිල වැඩිවීම.
5. රජය නිෂ්පාදකයන්ට සහනාධාර ලබාදීම. (..........)

15. කිසියම් භාණ්ඩයක සැපයුම් ශ්‍රිතය $Qs = -30 + 5P$ වේ. මෙහි සැපයුම් නම්‍යතාවයේ හැසිරීම පිළිබඳව කියවෙන නිවැරදි ප්‍රකාශය පහත පිළිතුරු ඇසුරෙන් තෝරන්න.

| සැපයුම් නම්‍යතාවය | මිල වැඩිවන විට නම්‍යතා සංගුණකය වෙනස්වන ආකාරය |
|---|---|
| 1. එකට වඩා අඩුවේ. | ඉහළ යයි |
| 2. එකට වඩා අඩුවේ | පහළ යයි |
| 3. එකට වඩා වැඩි වේ | පහළ යයි |
| 4. එකට වඩා වැඩි වේ | ඉහළ යයි |
| 5. ඒකීය නම්‍ය වේ | වෙනස් නොවේ |

(..........)

16. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ සැපයුම් වක්‍රය නොවෙනස්ව පවතිනුයේ පහත සඳහන් කවර කරුණක් වෙනස් වූ විටදී ද?

1. සම්බන්ධිත භාණ්ඩයක මිල
2. යෙදවුම් මිල
3. එම භාණ්ඩයේ මිල
4. රජයේ ප්‍රතිපත්ති
5. තාක්ෂණය (..........)


17. පහත සඳහන් නිෂ්පාදන ආයතන නිපදවන භාණ්ඩයක් සඳහා වූ මිල ඉල්ලුම් නම්‍යතාව පහත දැක්වේ.

1. A = 0.6 , B = 0.98 , C = 1.30 , D =1.0

සෑම ආයතනයක්ම තම නිෂ්පාදිතයේ මිල 10 % කින් ඉහළ දැමුවහොත් අයභාරය අඩුවනු ඇත්තේ කුමන ආයතනවල ද?

1. A හා B ආයතනවල
2. B හා C ආයතනවල
3. C හා D ආයතනවල
4. A ආයතනයේ පමණි.
5. C ආයතනයේ පමණි (..........)


18. පහත දැක්වෙන රූප සටහනට ගැලපෙන ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය කුමක් ද?




D - ඉල්ලුම් වක්‍රය

1. ආදේශන භාණ්ඩයේ මිල අඩුවීම, පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය වැඩිවීම.
2. නව ආදේශන වෙළෙඳපොළට ප්‍රවේශ වේ යැයි සැළකීම, පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය අඩුවීම.
3. අනාගත මිල ඉහළ යතැයි අපේක්ෂාව, පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය වැඩිවීම.
4. නිෂ්පාදන ආයතන සංඛ්‍යාව වැඩිවීම, පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය වැඩිවීම.
5. පාරිභෝගික බද්දක් පැනවීම, පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය අඩුවීම. (..........)


19. ආණ්ඩුව එක්තරා කෘෂිකාර්මික නිෂ්පාදිතයක් සම්බන්ධයෙන් සහතික මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරයි. ඊට අදාළ රූප සටහන පහත දැක්වේ.




රූප සටහනට අනුව මිල ආධාරක ප්‍රතිපත්තිය යටතේ රජය අතිරික්ත සැපයුම මිලදී ගැනීමේ වැඩ පිළිවෙල වෙනුවට ඌණ පූර්ණ ගෙවීම ක්‍රියාත්මක කළහොත් රජයේ වියදම කෙසේ වෙනස් වේද?

1. රුපියල් 90000 කින් වැඩි වේ
2. රුපියල් 60000 කින් වැඩි වේ.
3. රුපියල් 75000 කින් වැඩි වේ
4. රුපියල් 60000 කින් අඩු වේ.
5. වෙනසක් සිදු නොවේ. (..........)

20. එක්තරා භාණ්ඩයක වෙළෙඳපොළ සැපයුම් වක්‍රය විතැන් ව ඇති ආකාරය පහත රූප සටහනේ දැක්වේ.




සැපයුම් වක්‍රය එවැනි විතැන්වීමකට හේතුවිය හැක්කේ,

1. රජය විසින් අවම මිල සීමාවක් නියම කිරීම.
2. රජය විසින් පනවා තිබූ බද්දක් ඉවත්කර ගැනීම.
3. නව නිෂ්පාදන ආයතන සමූහයක් වෙළෙඳ පොළට ප්‍රවේශවීම.
4. රජය විසින් ලබා දී තිබූ නිෂ්පාදන සහනාධාරයක් ඉවත්කර ගැනීම.
5. පහළ මිලක් යටතේ ආදේශන භාණ්ඩයක් ආනයනය කිරීම. (..........)

21. පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයක අධි ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණයයි.

$Q_{ed} = 28 - 7p$ (අධි ඉල්ලුම් සමීකරණය)

$Qs = -8 + 6p$ (සැපයුම් සමීකරණය)

මෙහි සමතුලිත මිල හා ප්‍රමාණය වන්නේ පිළිවෙලින්,

1. රු.4 යි. ඒකක 16 යි
2. රු. 4 යි. ඒකක 56 යි
3. රු. 7 යි. ඒකක 20 යි
4. රු. 16 යි. ඒකක 34 යි
5. රු. 28 යි. ඒකක 56 යි (..........)

22. $Qd = 30 - 2p$

$Qs = 14 + 2p$

ඉහත දැක්වෙන ඉල්ලුම් හා සැපයුම් සමීකරණ උපයෝගී කරගෙන සමතුලිත මිලේ දී පාරිභෝගික අතිරික්තය ගණනය කළ විට ලැබෙන වටිනාකම වන්නේ,

1. රු. 18 යි
2. රු. 22 යි
3. රු. 44 යි
4. රු. 121 යි
5. රු. 242 යි (..........)

23. පහළට බෑවුම්වන වෙළෙඳෙපොල ඉල්ලුම් වක්‍රයක් සහ ඉහළට බෑවුම්වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රයක් සහිත භාණ්ඩයක යෙදවුම් මිල ඉහළයාමේ ප්‍රතිඵලයක් වනුයේ,

1. සමතුලිත මිල හා ප්‍රමාණය ඉහළ යාමය.
2. සමතුලිත මිල හා ප්‍රමාණය පහළ යාමය.
3. සැපයුම් වක්‍රය දකුණට විතැන්වීමය.
4. සමතුලිත මිල පහළ වැටීම හා සමතුලිත ප්‍රමාණය ඉහළ යාමය.
5. සමතුලිත මිල ඉහළ යාම හා සමතුලිත ප්‍රමාණය පහළ යාමය. (..........)

24. එක්තරා භාණ්ඩයකට සාමාන්‍ය ඉල්ලුමක් හා සැපයුමක් පැවති අතර මෙම භාණ්ඩය මත රජය රු. 10 ඒකක බද්දක් පනවන ලදී. බද්දෙන් පසු අපේක්ෂා කළහැකි සිදුවීම කුමක් ද?

1. පාරිභෝගික අතිරික්තය හා සමාජ ශුභ සාධනය ඉහළ යාමය.
2. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය පහළට යාමය.
3. ගැනුම්කරු ගෙවන මිල හා විකුණුම්කරුට ලැබෙන මිල පහළ යාමය.
4. සමාජ ශුභ සාධනය හා නිෂ්පාදන අතිරික්තය ඉහළ යාමය.
5. ගැණුම්කරුවන් ගෙවන මිල හා විකුණුම්කරුට ලැබෙන මිල ඉහළ යාමය. (..........)

25. සමතුලිත මිලට වඩා පහළ මිලක් නියම කරමින් පනවනු ලබන උපරිම මිල ප්‍රතිපත්තියක ප්‍රතිපලයක් වනුයේ වෙළෙඳපොළෙහි,

1. අධි සැපයුමක් හට ගැනීමය.
2. අධි ඉල්ලුමක් හට ගැනීමය.
3. සමතුලිත මිලක් ඇතිවීමය.
4. සැපයුම වැඩිවීමය
5. ඉල්ලුම අඩුවීමය. (..........)


26. ගෑස් සඳහා පවත්නා ඉල්ලුම අතිශයින් අනම්‍ය බවත් එහි සැපයුම අතිශයින් නම්‍ය බවත් සලකන්න. මෙම තත්ත්වය යටතේ ගෑස් මිළ මත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත් බදු බර,

1. ඉතා විශාල වශයෙන් රජය විසින් දරනු ලැබේ.
2. ඉතා විශාල වශයෙන් ගැණුම්කරුවන් විසින් දරනු ලැබේ.
3. ඉතා විශාල වශයෙන් විකුණුම්කරුවන් විසින් දරනු ලැබේ.
4. ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සම සමව දරනු ලැබේ.
5. මුළුමනින්ම ගැණුම්කරුවන් විසින් දරනු ලැබේ. (..........)

27. එක්තරා භාණ්ඩයකට පවතින ඉල්ලුම් තත්ත්වය පහත ඉල්ලුම් පත්‍රයෙන් දැක්වේ.

මෙම භාණ්ඩයේ නිමැවුම මත පනවනු ලබන ඕනෑම බද්දක්,

1. සැපයුම් වක්‍රයෙහි වෙනසක් ඇතිනොකරයි.
2. සැපයුම් වක්‍රය දකුණට විතැන් කරයි.
3. ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් කරයි.
4. බදු බර මුළු මනින්ම නිෂ්පාදකයා විසින් දරයි.
5. බද්දේ ප්‍රමාණයෙන්ම භාණ්ඩයේ මිල ඉහළ නොවෙයි. (..........)




28. නිෂ්පාදන ආයතනයක් හීනවන ඵල ලබන විට දැකිය හැකි ලක්ෂණය කුමක් ද?

1. ආන්තික ඵලදාව ඉහළයාම.
2. මුළු ඵලදාව අඩුවන වේගයෙන් ඉහළ යාම
3. ආන්තික පිරිවැය පහළ යාම
4. මුළු ඵලදාව වැඩිවන වේගයෙන් ඉහළ යාම
5. සාමාන්‍ය විචල්‍ය පිරිවැය පහළ යාම. (..........)

29. නිෂ්පාදනයේ ආරෝපිත පිරිවැයක් දක්නට ලැබේ නම්,

1. ගණකාධිකාරී ලාභ ආර්ථික ලාභයට වඩා වැඩිවනු ඇත.
2. ආර්ථික ලාභ සෑමවිටම ශුන්‍ය වනු ඇත.
3. ආර්ථික ලාභ ගණකාධිකාරී ලාභයට වඩා වැඩිවනු ඇත.
4. ගණකාධිකාරි ලාභ සෑමවිටම ශුන්‍යවනු ඇත.
5. ආර්ථික ලාභ හා ගණකාධිකාරි ලාභ එකිනෙකට සමානවනු ඇත. (..........)

30. නිෂ්පාදන ආයතනයක ස්ථාවර පිරිවැය දෙගුණ වුවහොත් එහි ආන්තික පිරිවැය
1. දෙගුණ වනු ඇත.
2. දෙගුණයකට වඩා වැඩිවනු ඇත.
3. ස්ථාවරව පවතිනු ඇත.
4. 50% කින් වැඩිවනු ඇත.
5. 100% කින් අඩුවනු ඇත. (..........)

31. නිෂ්පාදන ආයතනයක් ප්‍රමාණික ලාභ ලබන විට ඉටුවන කොන්දේසිය කුමක් ද?
1. MR = MC
2. MRP = MFC
3. TR = TC
4. TR > TC
5. P = AVC (..........)

32. නිෂ්පාදන ආයතනයක නිමැවුම 0 දී මුළු පිරිවැය රුපියල් මිලියන 200 කි. නිමැවුම ඒකක 100 දී මුළු පිරිවැය රුපියල් මිලියන 1600 ක් වේ. නිමැවුම ඒකක 100 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය පිළිවෙලින්,
1. රු. 2 ක් හා රුපියල් 14 කි.
2. රුපියල් 2 ක් හා රුපියල් 16 කි.
3. රුපියල් 200 ක් හා රුපියල් 80 කි.
4. රුපියල් 20 ක් හා රුපියල් 14 කි.
5. රුපියල් 200 ක් හා රුපියල් 16 කි. (..........)

33. නිමැවුම වැඩිකරන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) වක්‍රය සහ සාමන්‍ය පිරිවැය වක්‍රය (AC) අතර පරතරය ක්‍රමයෙන් අඩුවන්නේ,
1. නිමැවුම වැඩිකරනවිට මුළු ස්ථාවර පිරිවැය (TFC) ඉහළ යන නිසාය.
2. නිමැවුම වැඩිකරන විට ආන්තික පිරිවැය (MC) අඩුවන නිසාය.
3. නිමැවුම වැඩිකරන විට සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) අඩුවන නිසාය.
4. නිමැවුම වැඩිකරන විට ආන්තික පිරිවැය (MC) වැඩිවන නිසාය.
5. නිමැවුම වැඩිකරන විට සාමාන්‍ය පිරිවැය (AC) අඩුවන නිසාය. (..........)

34. කෙටිකාලීන සාමාන්‍ය පිරිවැය (AC) වක්‍රය පහළට ගමන් කරන විට,
1. ආන්තික පිරිවැය (MC) වක්‍රය ඉහළට ගමන් කරයි.
2. සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) වක්‍රය ඉහළට ගමන් කරයි.
3. ආන්තික පිරිවැය (MC) වක්‍රය ඊට වඩා වැඩි වේගයකින් පහළට ගමන් කරයි.
4. සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) ඊට වඩා වැඩි වේගයකින් ඉහළට ගමන් කරයි.
5. සාමාන්‍ය ඵලදා (AP) වක්‍රය ඊට වඩා සමාන වේගයකින් පහළට ගමන් කරයි. (..........)

35. ආන්තික පිරිවැය ආන්තික අයභාරය ඉක්මවන්නේ නම් ලාභ උපරිම කරන පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක කටයුතු කරන ආයතනයක්,
1. භාණ්ඩ මිල අඩු කරයි.
2. භාණ්ඩ මිල වැඩි කරයි.
3. නිෂ්පාදනය පුළුල් කරයි.
4. නිෂ්පාදනය අඩු කරයි.
5. ඉහත කිසිවක් සිදු නොකරයි. (..........)

36. පහත සඳහන් කුමන දෑ කතිපයාධිකාරි වෙළෙඳෙපොළ තත්ත්වයක ලක්‍ෂණ වන්නේ ද?
A. අලුතින් ආයතතන වෙළෙඳෙපොළට ඇතුලුවීමේ බාධක නැත.
B. වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වෙයි.
C. වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වෙයි.
D. සුවිශේෂි භාණ්ඩ නිපදවයි.
E. මිල නොවන තරඟයක් පවති.
1. A හා C පමණි.
2. A හා E පමණි.
3. C හා E පමණි.
4. D හා E පමණි.
5. E පමණි. (..........)

37. න්‍යායාත්මක වශයෙන් ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් පැවතිය නොහැක්කේ පහත සඳහන් කුමන වෙළෙඳෙපොළ තත්ත්වයක් තුළ ද?
1. පූර්ණ තරඟය
2. පූර්ණ තරඟය හා ඒකාධිකාරය
3. ඒකාධිකාරී තරඟය හා ඒකාධිකාරය
4. කතිපයාධිකාරය
5. ඒකාධිකාරය (..........)

38. කිසියම් නිෂ්පාදන සාධකයක සමස්ත ඉපැයුම් සංක්‍රාම ඉපැයුම්වලින් පමණක් සමන්විත වනුයේ එම සාධකයේ සැපයුම් වක්‍රය,

1. මිල අක්ෂයට සමාන්තරවන විටදීය.
2. ප්‍රමාණ අක්ෂයට සමාන්තරවන විටදීය.
3. මූලයෙන් ආරම්භවන වන විටදීය.
4. තිරස් අක්ෂයෙන් ආරම්භවන විටදීය.
5. සිරස් අක්ෂයෙන් ආරම්භවන විටදීය. (..........)

39. වෘත්තීය ක්‍රීඩකයකුගේ මාසික වැටුප රුපියල් ලක්ෂ 5 කි. ඔහු වෙනත් වෘත්තියක නිරතවේ නම් ඔහුට ලබාගත හැකි මාසික වැටුප රුපියල් ලක්ෂ 3 කි. මේ හා සම්බන්ධව පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. ඔහුගේ සංක්‍රාම ඉපැයුම් රුපියල් ලක්ෂ 5 ක් ව අතර ආර්ථික බදු කුලිය රුපියල් ලක්ෂ 3 කි.
2. ඔහුගේ සංක්‍රාම ඉපැයුම් ලක්ෂ 3 ක් වන අතර ආර්ථික බදු කුලිය රුපියල් ලක්ෂ 2 කි.
3. ඔහුගේ ආර්ථික බදුකුලිය රුපියල් ලක්ෂ 5 ක් වන අතර සංක්‍රාම ඉපැයුම් ශුන්‍ය වෙයි.
4. ඔහුගේ ආර්ථික බදුකුලිය ශුන්‍ය වන අතර සංක්‍රාම ඉපැයුම් රුපියල් ලක්ෂ 2 කි.
5. ඔහුගේ සංක්‍රාම ඉපයුම් රුපියල් ලක්ෂ 2 ක් වන අතර ආර්ථික බදු කුලිය රුපියල් ලක්ෂ 2.5කි. (..........)

40. තරඟකාරී නිෂ්පාදන සාධක වෙළෙඳපොළක් හා සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය වනුයේ කුමක්ද?

1. නිෂ්පාදන සාධකවලට පවතින්නේ වක්‍ර ඉල්ලුමකි.
2. ශ්‍රම වෙළෙඳපොළේ ඉල්ලුම හා සැපයුම මත ශ්‍රමයේ මිල වන වැටුප තීරණය වෙයි.
3. ප්‍රාග්ධන වෙළෙඳපොළේ ඉල්ලුම හා සැපයුම මත පොලී අනුපාතය තීරණය වෙයි.
4. ලාභ උපරිම කිරීමේ නිරත තරඟකාරී ව්‍යාපාර ආයතනයක් විචල්‍ය යෙදවුම් පිළිබඳව තීරණ ගනු ලබන්නේ ආන්තික අය භාර නිෂ්පාදිතය (MRP) සහ ආන්තික සාධක පිරිවැය MFC) සැසඳීමෙනි.
5. තරඟකාරී සාධක වෙළෙඳපළක ප්‍රශස්ත විචල්‍ය යෙදවුම් ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ ආන්තික අයභාර නිෂ්පාදිතය (MRP) ආන්තික පිරිවැයට (MFC) වඩා අඩු තත්වයක දීය. (..........)

41. සමස්ත ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බලපෑම් ඇති කරන මූලික විචල්‍යයන් සහ ආර්ථික විචල්‍යයන් සාර්ව ආර්ථික විචල්‍යයන් ලෙස හැඳින්වේ. පහත සඳහන් දෑ අතුරෙන් සාර්ව ආර්ථික විචල්‍යයක් නොවන්නේ,

1. සමස්ත නිමවුම
2. සේවා නියුක්තිය
3. පොදු මිල මට්ටම
4. සාධාරණත්වය
5. පොළී අනුපාතය (..........)

42. කාලයක් සමඟ ආර්ථිකයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ හැසිරීම ව්‍යාපාර චක්‍ර ලෙස හඳුන්වනු ඇත. එහි ඇතුළත් අවධි 4 පිළිවෙළින් දැක්වෙන ප්‍රකාශය,

1. පතුල ප්‍රසාරණ අවධිය, පසු බැසීමේ අවධිය, මුදුනත
2. මුදුනත පසුබැසීමේ අවධිය, පතුල, වර්ධන අවධිය
3. පසුබැසීමේ අවධිය, පතුල, ප්‍රසාරණ අවධිය, මුදුනත
4. පතුල, පසු බැසීමේ අවධිය, මුදුනත, ප්‍රසාරණ අවධිය
5. ප්‍රසාරණ අවධිය, මුදුනත, පසුබැසීමේ අවධිය, පතුල (..........)

43. ව්‍යාපාර චක්‍ර සම්බන්ධයෙන් ඔබ එකඟවන ප්‍රකාශය කුමක් ද?

1. විභව නිමැවුමෙන් සමස්ත ආර්ථිකයේ කෙටිකාලීන හැසිරීම් පෙන්නුම් කරයි.
2. ආර්ථිකයක සම්පත් පූර්ණ ලෙස සහ උපරිම ලෙස උපයෝජනය කළ විට උද්ධමන පීඩනයන් ගෙන් තොරව ලබාගත හැකි නිමැවුම සැබෑ නිමැවුම ලෙස සැලකේ.
3. කාලයත් සමඟ සැබෑ නිමැවුමට වඩා විභව නිමැවුම දෝලනය වේ.
4. පතුලේ සිට මුදුනත දක්වා ගමන් කරන අවධිය නිමැවුම පරතරය ලෙස හැඳින්වේ.
5. විභව නිමැවුම් මට්ටම සහ සැබෑ නිමැවුම් මට්ටම අතර වෙනස නිමැවුම් පරතරය ලෙස හැඳින්වේ. (..........)

44. නිමැවුම් පරතරය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් කවරක් නිවැරදි ද?

1. ආර්ථිකයේ සැබෑ නිමවුම් මට්ටම විභව නිමවුම් මට්ටම ඉක්මවා ගිය විට ඍණ නිමවුම් පරතරයක් ඇති වේ.
2. ආර්ථිකයේ සැබෑ නිමවුම විභව නිමවුමට වඩා අඩු වූ විට හට ගන්නා නිමවුම් පරතරය උද්ධමනීය පරතරයක් ඇතිවේ.
3. ආර්ථිකයේ සැබෑ නිමවුම විභව නිමවුමට වඩා අඩු වූ විට ධන නිමවුම් පරතරයක් ඇති වේ.
4. ව්‍යාපාර චක්‍රයේ සංකෝචන අවධියේ දී ආර්ථිකයේ ප්‍රතිගමනීය පරතරයක් ඇති වේ.
5. ආර්ථිකයේ සැබෑ නිමවුම විභව නිමැවුමට සමාන වනවිට නිෂ්පාදන සම්පත් පූර්ණ හා ප්‍රශස්ත වශයෙන් උපයෝජනය කෙරේ. එහිදී විරැකියා මට්ටමේ ශුන්‍ය තත්වයක් ඇති වේ. (..........)

45. ආර්ථික ප්‍රදේශයක් තුළ වර්ෂයකට වඩා නොඅඩු කාලයක් ආර්ථික ක්‍රියාකාරකම්වල නියුතුවී සිටින, එසේ කිරීමේ ආර්ථික අභිලාෂයක් ඇති ඒකක නේවාසික ඒකක ලෙස ජාතික ගිණුම්වලදී සැලකෙනු ඇත. පහත සඳහන් ඒකක අතුරින් නේවාසිකයින් ලෙස ඇතුලත් නොවන්නේ කුමන කණ්ඩායම ද?

1. ආර්ථික ප්‍රදේශය තුළ පිහිටි ජාත්‍යන්තර බහු ජාතික ආයතනවල සේවය කරන විදේශ කාර්ය මණ්ඩලය.
2. විදේශ රටවල අධ්‍යාපන කටයුතු කරන ශිෂ්‍යයන්
3. වසරකට වඩා අඩුකාලයක් විදේශයක ජීවත්වන කලා කරුවන්
4. වසරකට වඩා අඩු කාලයක් ආර්ථික ක්‍රියාකාරකම්වල නියුක්ත සංක්‍රමණික සේවකයන්.
5. ආර්ථික ප්‍රදේශය තුළ පිහිටි විදේශ තානාපති කාර්යාලවල සේවයට බඳවාගත් ස්වදේශකයින්. (..........)

46. පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

1. එකතු කළ අගයක් බිහිකෙරෙන යෙදවුම් අතරමැදි පරිභෝජනය ලෙස හඳුන්වනු ඇත.
2. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් මිලදී ගන්නා යෙදවුම් අතරමැදි පරිභෝජනය ලෙස හඳුන්වනු ඇත.
3. ප්‍රාථමික යෙදවුම් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වී අතුරුදන්වී යනු ඇත.
4. අතරමැදි යෙදවුම්වලට නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නැවත නැවතත් සහභාගී වීමේ හැකියාව පවතී.
5. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා ප්‍රාථමික යෙදවුම් ලෙස හඳුන්වනු ඇත. (..........)

47. සර්ව ආර්ථිකයකට අදාල කල්පිත දත්ත පහත දැක්වේ. වටිනාකම රුපියල් බිලියන,

| | |
|---|---|
| - ගැනුම්කරුවන්ගේ මිල අනුව සමස්ථ එකතුකල අගය | = 10 000 |
| - නිෂ්පාදිතය මත අය කරන ශුද්ධ බදු | = 1 200 |
| - ප්‍රවාහන ගාස්තු | = 500 |
| - ගැනුම්කරුවාට අඩු කළ නොහැකි වැට් බදු | = 1 500 |
| - වෙළෙඳ ආන්තිකයින් (වෙළෙඳ තීරුව) | = 1 000 |

ඉහත දත්ත වලට අදාලව නිෂ්පාදකයාගේ මිල අනුව සමස්ත එකතු කළ අගය

1. 5800 2. 7000 3. 8200 4. 13000 5. 14200 (..........)

48. එක්තරා ආර්ථිකයක අදාළ කල්පිත දත්ත පහත දැක්වේ.

| වටිනාකම | (රු. බිලියන) |
|---|---|
| - සේවක ආදායම | = 500 |
| - ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | = 2 000 |
| - මිශ්‍ර ආදායම් | = 1 000 |
| - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජය වියදම | = 50 |
| - නිෂ්පාදිතය මත වෙනත් බදු - එම සහනාධාර | = 150 |
| - භාණ්ඩ හා සේවාමත අයකරන ශුද්ධ බදු | = 300 |

ඉහත දත්ත අනුව මූලික මිලට සමස්ත එකතු කළ අගය කොපමණ ද?

1. 3700 2. 3850 3. 3900 4. 3950 5. 4000 (..........)

49. රටක දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී එයට ඇතුලත් නොවනුයේ කවරක් ද?

1. කොටස් ප්‍රාග්ධනය හිමිකරුවන්ට ගෙවන ලාභාංශය
2. සම්පත් හිමිකරුවන් වෙත ගෙවනු ලබන දේපොළ ආදායම්
3. සමාගම් විසින් රඳවාගනු ලබන ලාභ
4. ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම
5. විශ්‍රාමිකයින් සඳහා ලබාදෙන විශාම වැටුප් (..........)

50. කුටුම්භ සහ ව්‍යාපාර ආයතනවලින් පමණක් ආර්ථිකය සමන්විත වේ. එහි ආදායමේ චක්‍රීය ප්‍රවාහය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් විය යුතු ද?

1. ව්‍යාපාරික ආයතන ඉතිරි කිරීම් බිහිකෙරන අතර කුටුම්භ සම්පත් භාවිත කරන්නෝ වෙති.
2. ව්‍යාපාර ආයතන වැට්බදු එකතු කරන අතර කුටුම්භ බදු ආදායම ජනනය කරන්නෝ වෙති.
3. කුටුම්භ භාණ්ඩ හා සේවා පරිභෝජනය කරන්නන් වන අතර ව්‍යාපාරික ආයතන නිෂ්පාදන සම්පත් සපයන්නෝ වෙති.
4. කුටුම්භ නිෂ්පාදන සම්පත් සපයන්නන් වන අතර ව්‍යාපාරික ආයතන භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කරන්නෝ වෙති.
5. කුටුම්භ විසින් භාණ්ඩ හා සේවා බිහි කිරීම සිදුකරන ව්‍යාපාරික ආයතන සම්පත් පරිභෝජනය කරන්නෝ වෙති.

(..........)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, End Year Test, July 2019**

**ආර්ථික විද්‍යාව - II**
**Economics - II**

**21 S II**

පැය 03 යි
**Three hours**

විභාග අංකය : ........................................

උපදෙස් :

- ප්‍රශ්න පහක් පමණක් තෝරා පිළිතුරු ලියන්න.

01. අ) (i) සම්පත් හිඟකම ආර්ථික විද්‍යාවේ පදනමයි. පැහැදිලි කරන්න. (ලකුණු 02)
(ii) ව්‍යවසායකත්වය අර්ථ දක්වන්න. ව්‍යවසායකත්වයට අදාළ කාර්යයන් කවරේ ද? (ලකුණු 03)
(iii) සාධක ඵලදායිතාවය අර්ථ දක්වන්න. එය ගණනය කරන්නේ කෙසේ ද? (ලකුණු 03)
(iv) සම්පත්වල ඌණ උපයෝජනය නිෂ්පාදන හැකියා මායිමක දක්වන්නේ කෙසේ ද? එසේ දැක්වීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)
ආ) (i) වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් අවශ්‍යයෙන්ම ධනේශ්වර ආර්ථික පද්ධතියක් විය යුතු ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)
(ii) ආර්ථික කාර්යක්ෂමතාවය ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද? (ලකුණු 04)

02. (i) ඉල්ලුම් න්‍යාය හා ඉල්ලුම් නීතිය අතර වෙනස ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද? (ලකුණු 02)
(ii) සලකා බලන භාණ්ඩය සහල් නම් සහල් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වීමට බලපෑ හැකි හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)
(iii) එක්තරා භාණ්ඩයක මිල රු.10 ක් වන විට එහි ඉල්ලුම් ප්‍රමාණය ඒකක 100 කි. එම භාණ්ඩයේ මිල රු. 15 දක්වා වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය ඒකක 50 දක්වා අඩු විය. මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම ඒකීය නම්‍යවේ යයි ඔබ නිගමනය කරන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)
(iv) (අ) ව්‍යාපාරිකයෙකුට හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංකල්පය ප්‍රායෝගිකව වැදගත් වන අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
(ආ) අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට සැපයුම් ප්‍රමාණය එම භාණ්ඩයේ මිලෙහි ධන ශ්‍රිතයක් වේ.
(a) මෙහි අනෙකුත් සාධක යනු මොනවා ද? (ලකුණු 02)
(b) සැපයුම් ප්‍රමාණය මිලෙහි ධන ශ්‍රිතයක් වන්නේ කවර හේතු නිසා ද? (ලකුණු 02)
(v) භාණ්ඩයක සැපයුමේ මිල නම්‍යතාව තීරණය කරන සාධක හතරක් නම්කොට එම එක් එක් සාධක සැපයුම් නම්‍යතාව තීරණය වීමට බලපාන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

03. (i) ආර්ථික විද්‍යානුකූලව ''වෙළෙඳපොළ'' යන්න අර්ථ දක්වන්න. ආර්ථික විශ්ලේෂණයේ දී මුණගැසෙන ප්‍රධාන වෙළෙඳපොළ වර්ග දෙක නම්කොට ඒවා අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)
(ii) ''වෙළෙඳපොළ සමතුලිතය'' ප්‍රකාශ කල හැකි විකල්ප ක්‍රම හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)
(iii) තරඟකාරී වෙළෙඳපොළක අලෙවිවන එක්තරා භාණ්ඩයක මිල රුපියල් 4 ක් වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඒකක 84 කි. එම මිලේදී අධි ඉල්ලුම් ප්‍රමාණය ඒකක 72 කි. මිල රුපියල් 8.00 දක්වා ඉහළයන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඒකක 68 දක්වා අඩුවන අතර සැපයුම් කරනු ලබන ප්‍රමාණය ඒකක 44 දක්වා වැඩි වේ.
(අ) ඉල්ලුම් හා සැපයුම් වක්‍ර දෙකම රේඛීය වක්‍ර වේයයි උපකල්පනය කොට, වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සඳහා අදාළ සමීකරණ ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 04)
(ආ) ඉල්ලුම් හා සැපයුම් සමීකරණ උපයෝගී කරගනිමින් සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04)
(ඉ) සමතුලිත මිලේ දී පාරිභෝගික අතිරික්තයේ හා නිෂ්පාදන අතිරික්තයේ රුපියල් වටිනාකම ගණනය කරන්න. (ලකුණු 04)
(ඊ) සමතුලිත මිලේ දී මිල ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 02)

04. (i) **එක්තරා භාණ්ඩයක මිල රුපියල් 50 දී ඉල්ලුම් ප්‍රමාණය හා සැපයුම් ප්‍රමාණය ඒකක 800කි. එම මිලේ දී පාරිභෝගික අතිරික්තය රුපියල් 32000ක් වන අතර, නිෂ්පාදන අතිරික්තය රු. 16000ක් විය.**

(අ) මෙම භාණ්ඩය සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍රප්‍රස්තාර සටහනක ඇඳදක්වන්න.(ලකුණු 04)

(ආ) ඉහත භාණ්ඩයේ ඒකකයට රජය විසින් රු. 12.00ක බද්දක් පනවන ලදී. පහත දේ ගණනය කරන්න.

(A) බද්දෙන් පසු නිෂ්පාදකයාට ලැබෙන ශුද්ධ මිල (ලකුණු 02)

(B) රජයට ලැබෙන බදු ආදායම (ලකුණු 02)

(C) බද්ද නිසා සමාජ ශුභ සාධනයට වන බලපෑම (ලකුණු 02)

(ii) කිසියම් භාණ්ඩයක් සඳහා නිෂ්පාදන සහනාධාරයක් ලබාදුන් විට නිෂ්පාදකයන් බුක්තිවිඳින අතිරික්තය කෙරෙහි එය බලපාන ආකාරය ඉල්ලුම් හා සැපයුම් රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) (අ) රජය විසින් 'වී' සඳහා සඵල අවම මිලක් නියම කළේ යැයි සිතන්න. මෙම තත්ත්වය යෝග්‍ය ප්‍රස්තාර සටහනක දක්වා ඒ ඇසුරෙන් වෙළෙඳපොළේ හටගත හැකි ප්‍රතිවිපාක සඳහන් කරන්න. (ලකුණු 04)

(ආ) අවම මිල අර්ථවත් කරගැනීම සඳහා රජයට ගතහැකි මිල ආධාරක ප්‍රතිපත්ති ස්වරූප දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

05. (i) ගිණුම්කරණ පිරිවැය සහ ආර්ථික පිරිවැය යන සංකල්ප අතර වෙනස දක්වා උදාහරණයක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) නිෂ්පාදන ආයතනයක මුළු නිමැවුම ඒකක 500ක් වන අතර එක් නිමැවුම් ඒකකයක වෙළෙඳපොළ මිල රු.20 කි.

නිමැවුම ඒකක 5 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු. 200 වන අතර ආයතනයේ මුළු පිරිවැය මුළු ආදායමෙන් 75% ක් වේ.

අ. නිෂ්පාදන ආයතනයේ මුළු ආදායම කොපමණ ද?

ආ. නිෂ්පාදන ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණ ද?

ඉ. නිෂ්පාදන ආයතනයේ මුළු විචල්‍ය පිරිවැය කොපමණ ද?

ඊ. නිෂ්පාදන ආයතනයේ මුළු පිරිවැය කොපමණ ද?

උ. නිෂ්පාදන ආයතනයේ ලාභය කොපමණ ද? (ල 1 x 5 )

(iii) දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයේ හැඩයට හේතුවන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) ''කෙටිකාලීන ඵලදා වක්‍ර මෙන්ම පිරිවැය වක්‍රද හැසිරෙන්නේ හීනවන ආන්තික ඵලදා න්‍යායට අනුවය.'' සුදුසු ප්‍රස්තාර සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) ස්ථාවර පිරිවැය සහ විචල්‍ය පිරිවැය අතර පවතින වෙනස්කම් මොනවා ද? (ලකුණු 03)

06. අ) (i) ආයතන සංඛ්‍යාව, ප්‍රවේශය, භාණ්ඩයේ ස්වභාවය, ආයතනයේ ඉල්ලුම් වක්‍රය යන ප්‍රධාන කරුණු ඇසුරින් පූර්ණ තරගය සහ ඒකාධිකාරි තරගය සැසඳීමක් කරන්න. (ලකුණු 04)

(ii) ''ස්වභාවික ඒකාධිකාරය'' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03)

ආ) (i) තරගකාරී තත්වයක් යටතේ සාධක වෙළෙඳපොළක් යන්න අර්ථ දක්වන්න. (ලකුණු 03)

(ii) සාධක වලට පවතින්නේ ව්‍යුත්පන්න ඉල්ලුමකි. උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) ව්‍යාපාර ආයතනයක ආන්තික ද්‍රව්‍යමය නිෂ්පාදිතය (MPP) සහ ආන්තික අයභාරය නිෂ්පාදිතය (MRP) යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) යම් සාධකයක මුලු ඉපයුම ආර්ථික බදුකුලිය මගින් පමණක් සමන්විත වෙයි. රූප සටහනක් ඇසුරෙන් දක්වන්න. (ලකුණු 03)

07. (i) සමාජයක් විසින් සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය තුළින් ඉටු කරගැනීමට අපේක්ෂා කරන විවිධ අභිමතාර්ථ සාර්ව ආර්ථික අරමුණු වශයෙන් හැඳින්වේ. ඒවා නම් කරන්න. (ලකුණු 04)

(ii) කුටුම්බ සහ ආයතන අතර භාණ්ඩ-සේවා සහ නිෂ්පාදන සාධක ගලායන ආකාරය දැක්වෙන චක්‍රීය ප්‍රවාහ සටහනක් අඳින්න. මූල්‍ය ප්‍රවාහය හා මූර්ත ප්‍රවාහය, සාධක වෙළෙඳපොළ භාණ්ඩ වෙළෙඳපොළ එම සටහනෙහි දක්වන්න. එක් එක් ප්‍රවාහයන් යොමුවන දිසාව ද පෙන්නුම් කරන්න. (ලකුණු 04)

(iii) කිසියම් රටක දළ දේශීය නිෂ්පාදිතය මිනුම් කිරීමේ දී පහත සඳහන් ආර්ථික කටයුතු අතුරින් කවරක් ඇතුළත් කරන්නේ ද? කවරක් බැහැර කරන්නේ ද? පැහැදිලි කරන්න.

(අ) කුටුම්භයක් පාවිච්චි කරන ලද මෝටර් රථය රුපියල් ලක්ෂ 10කට වෙනත් කුටුම්භයකට අලෙවි කිරීම

(ආ) උකස් කරුවන් තමන්ගෙ අරමුදල් ණයට දී උපයන පොළී ආදායම

(ඉ) පියා විසින් සෑම සතියකදීම එක් දිනක් තම දියණියට ඉංග්‍රීසි පාඩමක් ඉගැන්වීම.

(ඊ) පුද්ගලයෙක් වැවට ගොස් මසුන් අල්ලාගෙන ගෘහ පරිභෝජනයට ගැනීම. (ලකුණු 1 × 4)

(iv) එක්තරා ආර්ථිකයක කිසියම් වර්ෂයකට අදාළ කල්පිත දත්ත පහත දැක්වේ. (වටිනාකම රුපියල් මිලියන)

| ආර්ථික කටයුතු | නිමැවුමේ දළ වටිනාකම | අතරමැදි පරිභෝජනය |
|---|---|---|
| කෘෂි කර්මාන්තය | 17 000 | 6 000 |
| කාර්මික අංශය | 24 000 | 5 000 |
| සේවා අංශය | 30 000 | 10 000 |

| | | |
|---|---|---|
| භාණ්ඩ සහ සේවා මත අයකරන බදු සහනාධාර | = | 5000 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | = | - 3000 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | = | 1000 |
| ගම්‍ය මිල දර්ශකය | = | 112 |
| පෙර වර්ෂයේ ස්ථාවර මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය | = | 27500 |
| ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම | = | 2000 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) දළ දේශිය නිෂ්පාදිතය (වෙළෙඳමිල අනුව) (ලකුණු 03)
(ආ) දළ ජාතික ආදායම (ලකුණු 02)
(ඉ) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 01)
(ඊ) ශුද්ධ දේශීය නිෂ්පාදනය (ලකුණු 01)
(උ) උපයෝජ්‍ය දළ ජාතික ආදායම (ලකුණු 01)

08. (i) ආර්ථිකයක සමාහාර ඉල්ලුමේ සංරචක දක්වන්න. (ලකුණු 04)
(ii) ආර්ථිකයක රේඛීය පරිභෝජන ශ්‍රිතයේ තොරතුරු පහත දැක්වේ.

| වැය කළ හැකි ආදායම (රුපියල් මිලියන) | පරිභෝජන වියදම (රුපියල් මිලියන) |
|---|---|
| 2 500 | 2 200 |
| 3 000 | 2 600 |

(අ) මෙම ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.
(ආ) පරිභෝජන ශ්‍රිතයට අදාල ඉතිරි කිරීම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.
(ඉ) ඉතිරි කිරීමේ ශුන්‍යවන ආදායම ගණනය කරන්න. (ල 2 x 3)

(iii) එක්තරා ආර්ථිකයක ආදායම රුපියල් 2000 දී සාමාන්‍ය පරිභෝජන නැමියාට (APC) 0.9 වූ අතර ආන්තික පරිභෝජන හැකියාව (MPC) 0.8 ක් විය. මෙම ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 02)

(iv) එක්තරා ආර්ථිකයක් සම්බන්ධ ආර්ථික දත්ත පහත දැක්වේ. (වටිනාකම රුපියල් මිලියන වලිනි)
පරිභෝජනය (C) = 200 + 0.8 yd
ආයෝජන වියදම (I) = 200

(අ) මෙම ආර්ථකයේ ආදායමේ සමතුලිත අවස්ථාව ගණනය කරන්න. (ලකුණු 02)
(ආ) සමතුලිත ආදායමේ දී පරිභෝජන වියදම සහ ඉතිරිකිරීම් කොපමණ ද? (ලකුණු 02)
(ඉ) ආයෝජන වියදම 200කින් වැඩිවුවහොත් නව සමතුලිත ජාතික ආදායම කොපමණ ද? (ලකුණු 02)
(ඊ) ආයෝජන වියදම රුපියල් මිලියන 100කින් අඩුකළේ නම් නව සමතුලිත ජාතික ආදායම කවර අගයකු ගනු ලබයි ද? (ලකුණු 02)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Answers**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, End Year Test, July 2019**

## ආර්ථික විද්‍යාව - Economics
## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. 4 | 11. 2 | 21. 1 | 31. 3 | 41. 4 |
| 02. 1 | 12. 1 | 22. 4 | 32. 1 | 42. 3 |
| 03. 5 | 13. 2 | 23. 5 | 33. 3 | 43. 5 |
| 04. 2 | 14. 4 | 24. 2 | 34. 3 | 44. 4 |
| 05. 4 | 15. 3 | 25. 2 | 35. 4 | 45. 5 |
| 06. 3 | 16. 3 | 26. 2 | 36. 3 | 46. 2 |
| 07. 3 | 17. 5 | 27. 5 | 37. 1 | 47. 2 |
| 08. 1 | 18. 3 | 28. 2 | 38. 2 | 48. 1 |
| 09. 1 | 19. 5 | 29. 1 | 39. 2 | 49. 5 |
| 10. 2 | 20. 4 | 30. 3 | 40. 5 | 50. 4 |

### II පත්‍රය

01

(අ) I මිනිස් වුවමනාවන් අසීමිත වුවත් ඒවා ඉටුකර ගැනීමටඅවශ්‍ය භාණ්ඩ හා සේවා නිපදවීමට ප්‍රමාණවත් තරම් සම්පත් ඕනෑම රටක නැත. එම නිසා ඕනෑම සමාජයක් විසින් මූලික ආර්ථික ප්‍රශ්න වලට මුහුණ දීමට සිදුවන නිසා එය අවධාරණය කෙරෙන ආර්ථික විද්‍යාවේ පදනම සම්පත් හිඟකම වෙයි.

(ලකුණු 02 යි)

II අනෙකුත් නිෂ්පාදන සාධක සංචලනය කරමින් නිෂ්පාදන තීරණ ගනිමින් නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම ව්‍යවසායකත්වය වෙයි. (ලකුණු 01 යි)

ව්‍යවසායකත්වයට අදාල කාර්යයන් නම්.


- නිෂ්පාදන කටයුතු පිළිබඳව තීරණ ගැනීම.
- නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම.
- නව්‍යතා වාණිජ පදනමකින් වෙළඳපළට හඳුන්වාදීම.
- අවදානම් වලට මුහුණදීම.

එක් කරුණකට ලකුණු 1 බැගින් (ලකුණු 02 යි)

III සාධක ඵලදායිතාව යනු ''යෙදවුම් ඒකකයක සාමාන්‍ය නිමවුමයි.'' (ලකුණු 02 යි)

එය ගණනය කරනුයේ පහත ආකාරයටයි. $\dfrac{\text{නිමවුම්}}{\text{යෙදවුම්}}$ = සාධක ඵලදායිතාවය (ලකුණු 01 යි)

IV සම්පත් ඌණ උපයෝජනය ලෙස හඳුන්වන්නේ තිබෙන සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට නොගෙන තිබෙන බවයි. එවිට ආර්ථිකයට ලබාගත හැකි වන්නේ විභව නිමවුමට වඩා අඩු නිමැවුම් සංයෝගයකි. එම නිසා එය නිෂ්පාදන හැකියා මායිම් රූප සටහනක ඇතුලත ලක්ෂයකින් දක්වීමට සිදුවේ.




රූපසටහනට ලකුණු 2 යි.
පැහැදිලි කිරීමට ලකුණු 2 යි.

ආ) I. වෙළඳ පොල ආර්ථිකයක් අවශයෙන්ම ධනේෂ්වර ආර්ථික පද්ධතියක් විය යුතු නොවෙයි. වෙළඳ පොළ ආර්ථිකයක් යන්න නිගමනය කරනු ලබන්නේ සම්පත් බෙදා හැරීම මිල යන්ත්‍රණයෙන් සිදුවන විටයි. එවැනි ආර්ථික පද්ධති බොහෝ විට පෞද්ගලික දේපළ අයිතිය හිමි ධනේෂ්වර ආර්ථික පද්ධති සමඟ අත්වැල් බැඳ ගනී.

(ලකුණු 02 යි)

එහෙත් සැම විටම එසේ විය යුතු නැත හේතුව නම් දේපොළ අයිතිය රජය සතුවන සමාජවාදී දර්ශනය මත පදනම් වූ මිල යන්ත්‍රනයට යම් ප්‍රමාණයකට ඉඩ හැර තිබෙන ආර්ථික පද්ධති දැකගත හැකි නිසායි. ඒවා සමාජවාදී වෙළඳපොළ ආර්ථික පද්ධති වෙයි. (උදා : චීනය) (ලකුණු 02 යි)

II. නිෂ්පාදන කාර්යක්ෂමතාව හා සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාවය සහිතව ආර්ථිකයේ හිඟ සම්පත් විවිධ නිෂ්පාදන කටයුතු වලට යොදවා තිබීම ආර්ථික කාර්යක්ෂමතාවය වෙයි. (ලකුණු 02 යි)

මේ සඳහා අවශ්‍ය කොන්දේසි 2 කි.

නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය.

අවම යෙදවුම් පිරිවැයක් තුල උපරිම නිමැවුමක් ලබා ගැනීම මෙයින් අදහස් කරන අතර ඒ සඳහා අවශ්‍ය කොන්දේසි දෙක වනුයේ පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනයයි. (ලකුණු 01 යි)

සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය.

එනම් සමාජයට වඩාත්ම ගැලපෙන නිමැවුම් සංයෝගය බිහිවන ආකාරයට සම්පත් බෙදී යාමයි. එහිදී අවශ්‍ය වන කොන්දේසිය නම් ආන්තික ප්‍රතිලාභ = ආන්තික පිරිවැය

$$MB/P = MC$$

(ලකුණු 01 යි)

02 I
- ඉල්ලුම තීරණය වීමට බලපාන ඕනෑම සාධකයක් වෙනස් වීමට අනුකූලව සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම වෙනස් වන ආකාරය විග්‍රහ කොට දැක්වීම ඉල්ලුම් න්‍යායවේ.
- දෙන ලද අවස්ථාවකදී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල හා එහි ඉල්ලුම් ප්‍රමාණය අතර පවතින ප්‍රතිලෝම සම්බන්ධතාව ඉල්ලුම් නීතිය ලෙස හැදින්වේ.
- ඉල්ලුම් න්‍යාය පුළුල් සංකල්පයක් වන අතර ඉල්ලුම් නීතිය තුල අඩංගු පටු සංකල්පයකි. (ලකුණු 02 යි)

II
- තිරිඟු පිටි වැනි ආදේශක මිල ගණන් ඉහළ යාම.
- එළවළු පොල් වැනි ප්‍රතිබද්ධ/අනුපූරක මිල ගණන් පහත වැටීම.
- සහල් පරිභෝජනය කරන්නන්ගේ ආදායම වැඩි වීම.
- අනාගතේ සහල් මිල ගණන් ඉහළ යනු ඇතැයි අපේක්ෂාකිරීම.
- සහල් වෙළඳපොලේ ගැනුම් කරුවන් සංඛ්‍යාව ඉහළයාම. (ලකුණු 04 යි)

III

| මිල (රු) | ප්‍රමාණය (ඒකක) | පාරිභෝගික (රු) |
|---|---|---|
| 10 | 100 | 1000.00 |
| 15 | 50 | 750.00 |

ලක්ෂ්‍ය නම්‍යතාවය අනුව ඒකීය නම්‍ය වේ.

$$P\&d = \frac{\Delta Q}{\Delta P} \text{ x } \frac{P}{Q}$$

$$= \frac{50}{5} \text{ x } \frac{10}{100}$$

$$= \underline{\underline{1}}$$

නමුත් චාප නම්‍යතාව අනුව ඒකීය නොවේ.

$$P\&d = \frac{\Delta Q}{\Delta P} \text{ x } \frac{P_1+P_2}{Q_1+Q_2}$$

$$= \frac{50}{5} \text{ x } \frac{10 + 15}{100 + 150}$$

$$= \frac{50}{5} \text{ x } \frac{25}{150}$$

$$= \underline{\underline{1.67}}$$

(ලකුණු 02 යි)

ඒකීය නම්‍යතාවයකදී සෑම මිලක් යටතේම පාරිභෝගික පැහැදම සමාන අගයක් ගත යුතුය. එහෙත් මෙහිදී එකිනෙක මිල යටතේ පාරිභෝගික පැහැදම අසමානය. එබැවින් මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම ඒකීය නම්‍යවේයයි නිගමනය කල නොහැකිය.

(ලකුණු 02)

IV. (අ) සලකා බලන භාණ්ඩයේ 'මිල' හැර සැපයුම කෙරෙහි බලපාන සෙසු සාධක, අනෙකුත් සාධක ලෙස හඳුන්වයි.

උදා : සම්බන්ධිත භාණ්ඩ මිල ගණන්

යෙදවුම් මිල.

තාක්ෂණය.

නිෂ්පාදකයන්ගේ අපේක්ෂා ආදිය.

(ආ) සැපයුම් නීතියට වැඩිවන ආන්තික පිරිවැය නීතියේ බලපෑම නිසාය. (ලකුණු 02)

කිසියම් භාණ්ඩයක් වැඩියෙන් නිෂ්පාදනය කරන විට එහි ආවසථික පිරිවැයද ඉහළ යයි. නිමැවුම වැඩිවන විට ආන්තිකපිරිවැය ද ඉහළ නගින බැවින් සිය නිෂ්පාදනය වැඩි කිරීමට නිෂ්පාදකයන් පෙළඹෙනුයේ වැඩිවන ආන්තික පිරිවැය පියවාගැනීමට හැකිවන පරිදි භාණ්ඩයේ මිල ඉහළ නගිනවානම් පමණි. (ලකුණු 02)

IV. (අ)

- තම භාණ්ඩය සඳහා වෙළඳපොළේ පවතින තරඟකාරීත්වය තීරණය කිරීමට.
- භාණ්ඩ වර්ග අතරේ පවතින අන්තර් සබඳතා විග්‍රහ කරගැනීමට / ආදේශන භාණ්ඩ හෝ අනුපූරක භාණ්ඩ හඳුනාගැනීමට.
- භාණ්ඩ හා සේවා වල සාපේක්ෂ ඉල්ලුම වෙනස් වීම පුරෝකථනය කිරීමට. (ලකුණු 02)

V. ● සාධක සංචලන හැකියාව.

සාධක සංචලන හැකියාව වැඩිවන විට සැපයුම නම්‍යවේ. සාධක සංචලන හැකියාව දුෂ්කර වන විට සැපයුම අනම්‍ය වේ.

- භාණ්ඩයේ ස්වභාවය.

කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය සඳහා භාවිතා කරන නිෂ්පාදන සාධකයක් වෙනත් නිෂ්පාදන කාර්යක් සඳහා ආදේශ කිරීමේ හැකියාව වැඩිනම් සැපයුම නම්‍යවේ.

- තොග පවත්වාගෙන යාමේ හැකියාව. තොග පවත්වාගෙන යාමේ හැකියාව වැඩිනම් එම භාණ්ඩ සඳහා නම්‍ය සැපයුමක් පවතී.
- මිල වෙනස් වීම හේතුවෙන් සැපයුම් වෙනස් කිරීමට ගතවන කාලය මිල වෙනස් වීමෙන් පසු ගතවී ඇති කාලය විශාල නම් එවැනි භාණ්ඩ සඳහා ඇත්තේ නම්‍ය සැපයුමකි. (ලකුණු 04)

(3) I. භාණ්ඩ හා සේවා හෝ නිෂ්පාදන සාධක මිලදී ගැනීමේ හෝ විකිණීමේ අරමුණින් ගැනුම්කරුවන් හා විකුණුම් කරුවන් අතර හුවමාරු සම්බන්ධතාවයක් ඇතිවිය හැකි ඕනෑම තත්ත්වයක් (ස්ථානයක් හෝ අවකාශයක්) වෙළඳ පොලක් ලෙස හඳුන්වයි. (ලකුණු 01)

ආර්ථික විශ්ලේෂනය අනුව හඳුනාගත හැකි වෙළඳපොළ ප්‍රභේද දෙකකි.

1. භාණ්ඩ හා සේවා වෙළඳ පොළ
2. සාධක වෙළඳ පොළ

(ලකුණු 01)

| භාණ්ඩ හා සේවා වෙළඳ පොළ | සාධක වෙළඳ පොළ |
|---|---|
| 1. පරිභෝජන භාණ්ඩ හා සේවා හුවමාරු වේ<br>2. කුටුම්භ අංශය භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම් කරයි.<br>3. ඍජු ඉල්ලුමක් පවතී. | සාධක සේවා හුවමාරු වේ.<br>නිෂ්පාදන ආයතන සාධක සේවා ඉල්ලුම් කරයි. |

II ● අපේක්ෂිත ඉල්ලුම් මිල අපේක්ෂිත සැපයුම් මිලට සමාන විය යුතුය. (ලකුණු 1x2 = 2)

- අපේක්ෂිත ඉල්ලුම් ප්‍රමාණය අපේක්ෂිත සැපයුම් ප්‍රමාණයට සමාන විය යුතුය.
- අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය ශූන්‍ය විය යුතුය.

(ලකුණු 1/2x4 = 2)

- අධි ඉල්ලුම් මිල හා අධි සැපයම් මිල ශූන්‍ය විය යුතුය.

III (අ)

| | මිල (රු) | ඉ.ප්‍ර(ඒකක) | සැප්‍ර (ඒකක) |
|---|---|---|---|
| | 4.00 | 84 | 12 |
| | 8.00 | 68 | 44 |

ඉල්ලුම් සමීකරණය : Qd = a - bp
Qd = 100 - 4p

සැපයුම් සමීකරණය : Qs = a - bp
Qs = -20 + 8p

(ලකුණු 02) (ලකුණු 02) (ලකුණු 04)

(ආ) Qd = Qs

100-4p = -20 + 8p

120 = 12

10 = p (සමතුලිත මිල රු.10යි)

(ලකුණු 02)

Qd = 100-4(10)

= 60 (සමතුලිත ප්‍රමාණය ඒකක 60 යි)

(ලකුණු 02)

(ඉ) පාරිභෝගික අතිරික්තය $= \frac{(25 - 10) \times 60}{2}$

$= \frac{15 \times 60}{2}$

$= \frac{900}{2}$

= රු. 450.00 (ලකුණු 02)

නිෂ්පාදන අතිරික්තය $= \frac{(10 - 2.50) \times 60}{2}$

= රු. 225.00 (ලකුණු 02)

(ඊ) මිල ඉල්ලුම් නම්‍යතාව $= b \times \frac{p}{Qd}$

$= --4 \times \frac{10}{60}$

$= \frac{40}{60}$

= - 0.66

සැපයුම් නම්‍යතාව $= b \times \frac{p}{Qs}$

$= -8 \times \frac{10}{60}$

$= \frac{80}{60}$

= 1.33


(ලකුණු 02)

04. (i)(අ)

| මිල (රු) | ඉ.ප්‍ර (ඒකක) | සැ.ප්‍ර (ඒකක) |
|---|---|---|
| 50 | 800 | 800 |

ඉල්ලුම් ප්‍රමාණය ශූන්‍යවන මිල = රු. 130

සැපයුම් ප්‍රමාණය ශූන්‍යවන මිල = රු. 10




(නිවැරදි රූපසටහනට ලකුණු 04)

පාරිභෝගික අතිරික්තය ඇසුරින් ඉල්ලුම් මිල සෙවීම.

පාරිභෝගික අතිරික්තය $= \frac{(P-500)\ 800}{2}$

$32000 = (p_1 - 50)\ 400$

නිෂ්පාදන අතිරික්තය ඇසුරින් සැපයුම් මිල සෙවීම.

නිෂ්පාදන අතිරික්තය $= \frac{(50-P_2)\ 800}{2}$

$16000 = (50 - P_2)\ 400$

(ආ) (A) නිෂ්පාදකයාට ලැබෙන ශුද්ධ මිල = රු.46.00

(B) රජයට ලැබෙන බදු ආදායම = 12 x 720


= 8640 (ලකුණු 02)

(C) සමාජයට වන බලපෑම/අධි බදු බර = 12 (800-720) / 2

= 12 x80 / 2

= 480 (ලකුණු 02)


(ii)




සහනාධාරයට පෙර නිෂ්පාදන අතිරික්තය = A + B

සහනාධාරයට පෙර නිෂ්පාදන අතිරික්තය = A + B+C + F (රූප සටහනට ල.2 , පැහැදිලි කිරීමට ල.2)

(iii)




ඉහත රූප සටහනේ දැක්වෙන පරිදි $P_1$ අවම මිල සීමාව නියම කිරීම නිසා වෙළඳපොල සැපයුම් ප්‍රමාණය $Q_1$ - $Q_2$ දක්වා වැඩිවන අතර, ඉල්ලුම් ප්‍රමාණය $Q_1$ - $Q_2$ දක්වා අඩුවේ. මෙහි ප්‍රතිඵලය වන්නේ $Q_1$ - $Q_2$ දක්වා වන අධි සැපයුමක් වෙළඳපොළෙහි හටගනී. (ලකුණු 02)

විකල්ප පිළිතුරු - අතිරික්ත නිෂ්පාදනය වෙළඳපොළෙහි ගොඩනැගීම හෙවත් තොග සමුච්චනය වීම.
- වෙළෙඳුන් නීතියෙන් පලායාමට තැත් කිරීම.
- අධි ආයෝජන තත්ත්වයක් උද්ගතවීම. (ලකුණු 02)

ආ) - රජයේ මිලදී ගැනීමේ සහිත මිල අධාරක ප්‍රතිපත්ති
- ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය. (ලකුණු 02)

(5) i. ගිණුම්කරණ පිරිවැය යනු නිෂ්පාදන කටයුතත්කදී පිටතින් මිලදී ගන්නා යෙදවුම් වෙනුවෙන් දැරීමට සිදුවන මූල්‍ය පිරිවැයයි. (ලකුණු 02)

උදා: ශ්‍රමික වැටුප් සඳහා දරන වියදම්

ආර්ථික පිරිවැය යනු නිෂ්පාදන ක්‍රියාවලියේදී කැප කරනු ලබන සියළුම සම්පත්වල ආවස්ථික පිරිවැයයි.

ආර්ථික පිරිවැය = ගිණුම්කරණ පිරිවැය + ආරෝපිත පිරිවැය

ගිණුම්කරණ පිරිවැයෙහි ආරෝපිත පිරිවැය ඇතුළත් නොවේ. (ලකුණු 02)

ii. අ) රු.10,000 ආ) රු.1000


ඇ) රු.6500 ඇ) රු.7500

ඉ) රු.2500 (ලකුණු 05)

iii.දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය වඩා පැතලි ඉංග්‍රීසි U අකුරේ හැඩය ගනී දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයේ හැඩයට හේතුවන්නේ පරිමාණානුකූල එල තුලින් හටගන්නා පරිමාණානුකූල පිරිමැසුම් හා පරිමාණානුකූල නොපිරිමැසුම්ය.

ඒ අනුව වැඩිවන පරිමාණානු කූල ඵල ලැබෙන අවධියේදී ඇතිවන පරිමාණානුකූල පිරිමැසුම් නිසා දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පහළට ගමන් කරයි. ස්ථාවර පරිමාණානුකූල ඵල ලැබෙන අවධියේදී LAC වක්‍රය තිරස් අක්ෂයට සමාන්තරව පිහිටන අතර හීනවන පරිමාණානුකූල ඵල ලැබෙන අවදියේදී හට ගන්නා පරිමාණානුකූල නොපිරිමැසුම් නැවත ඉහළට ගමන් කරයි. (ලකුණු 04)

iv. කෙටිකාලීන ඵලදා වක්‍ර මෙන්ම පිරිවැය වක්‍රද හීන වන ආන්තික ඵලදා න්‍යායට අනුව හැසිරෙන අතර ඒ අනුව කෙටිකාලීන පිරිවැය වක්‍ර ඵලදා වක්‍ර වලට ප්‍රතිවිරුද්ධ හැඩය ගනී.




(රූප සටහනට ල.2 , පැහැදිලි කිරීමට ල.2)

ආන්තික ඵලදාව උපරිම වන ලක්ෂ්‍යයේදී ආන්තික පිරිවැය අවම අගයක් දක්වා පහත වැටේ. ඒ අනුව MP වනුයේ ඵලදායිතාව ඉහළම අගයක් ගන්නා විට MC අවම වන්නේ හීනවන ආන්තික ඵලදායි න්‍යායට අනුවයි.

සාමාන්‍ය ඵලදායි උපරිම වන ලක්ෂයේදී MP=AP වන අතර එම ලක්ෂයේදී AVC අවම වී AVC=MC වේ. හීනවන ඵල ක්‍රියාත්මක වන විට MP වක්‍රයේ AP වක්‍රයේ උපරිම ලක්ෂය ඡේදනය කරමින් වේගයෙන් පහළට ගමන් කරන අතර MC වක්‍රයද AVC වක්‍රයේ අවම ලක්ෂය ඡේදනය කරමින් ඉහළට ගමන් කරයි.

V.

| ස්ථාවර පිරිවැය | විචල්‍ය පිරිවැය |
|---|---|
| ස්ථාවර යෙදවුම් අත්පත් කර ගැනීමට දරන පිරිවැය. | විචල්‍ය යෙදවුම් අත්පත් කර ගැනීමට දරන පිරිවැය. |
| නිමැවුම සමඟ වෙනස් නොවන පිරිවැයකි. | නිමැවුම සමඟ වෙනස් වන පිරිවැයකි. |
| නිමැවුම ආරම්භ කිරීමට පෙර දරණු ලැබේ. | නිමැවුම ආරම්භ වීමත් සමගම දරණු ලැබේ. |
| නිෂ්පාදන ආයතනයක අනාගතය පිළිබඳ තීරණ ගැනීමේදී අදාල කර නොගනී. | නිෂ්පාදන ආයතනයක අනාගතය පිළිබඳ තීරණ ගැනීමේදී අදාල කරගනී. |

(ලකුණු 03)

(6) අ.

| | පූර්ණ තරගය | ඒකාධිකාරී තරගය |
|---|---|---|
| 1. ආයතන සංඛ්‍යාව | අසීමිතයි (විශාලයි) | විශාලයි |
| 2. ප්‍රවේශය | අබාධ ප්‍රවේශය | අබාධ ප්‍රවේශය |
| 3. භාණ්ඩයේ ස්වභාවය | සමජාතීය භාණ්ඩ | ප්‍රභේදිත භාණ්ඩ |
| 4. ආයතනයේ භාණ්ඩ සඳහා ඉල්ලුම් වක්‍රය | පූර්ණ නම්‍ය | පහළට බෑවුම් වේ. |

(මෙම ප්‍රධාන කරුණු සැසඳීමට පමණක් එක් සැසඳීමකට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 4 යි.)

II. කිසියම් කර්මාන්තයක සිටින ආයතන දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් භාණ්ඩයක් වෙළඳපළට සපයන මිලට වඩා අඩු මිලට මුලු වෙළඳපොලටම අවශ්‍ය භාණ්ඩ ප්‍රමාණය යම් ආයතනයකට සැපයීමට හැකිවීම ස්වභාවික ඒකාධිකාරිය වෙයි. මෙම තත්ත්වය ආයතන මහා පරිමාන වීමේදී පරිමාණුකූල පිරිමැසුම් ලබන විට අත්කර ගත හැකි වෙයි. (ලකුණු 03 යි)

(ආ) I. සාධක වලට පවතින ඉල්ලුම හා සැපයුම මත සාධක මිල හා සමතුලිත සේවා නියුක්ති සාධක ප්‍රමාණය තීරණය වන වෙළඳපොලකි. එම වෙළඳපොල සාධක ඉල්ලුම්කරුවන් නිෂ්පාදන / ව්‍යාපාරික අංශය වන අතර සාධක සැපයුම් කරුවන් වනුයේ කුටුම්භ අංශයයි. (ලකුණු 03)

II. සාධක ඇසුරින් නිපදවන භාණ්ඩ හා සේවා වලට පවතින ඉල්ලුම මත සාධක වලට ඉල්ලුම බිහිවන නිසා සාධක වලට වක්‍ර/ව්‍යුත්පන්න ඉල්ලුමක් පවතින බව කියනු ලබයි.


උදා : පාරිභෝගිකයින් පාන් වලට කරන ඉල්ලුම තීරණයවීම (ගැලපෙන ඕනෑම උදාහරණයට ලකුණු 01 යි)

III. ආන්තික ද්‍රව්‍යමය නිෂ්පාදනය යනු අතිරේක විචල්‍ය යෙදවුමක් මගින් මුලු ද්‍රව්‍යමය නිෂ්පාදනයට එකතුවන නිමවුමයි. (ලකුණු 02)

ආයතනික අයභාර නිෂ්පාදිතය (MPP) යනු, ආන්තික ද්‍රව්‍යමය නිෂ්පාදිතයේ මූල්‍යමය වටිනාකමයි. එය ආන්තික ද්‍රව්‍යමය නිෂ්පාදිතය ආන්තික අයභාරයෙන් ගුණකලවිට ලැබේ.

MRP = MPP × P/mR (ලකුණු 02)

IV. යම් සාධකයක මුලු ඉපයුම් ආර්ථික බදුකුලියෙන් පමණක් සමන්විත වනුයේ එම සාධකයේ සැපයුම පූර්ණ අනම්‍ය වන විටයි.




(රූප සටහනට ලකුණු 01)


(7) (i) පූර්ණ සේවා නියුක්තිය - ආර්ථික වර්ධනය සහ සංවර්ධනය

ආර්ථික ස්ථායිතාවය - තිරසර සංවර්ධනය

සාධාරණාත්මය (ලකුණු 04)

- මූර්ත ප්‍රවාහ දිසාවක් සමග නිවැරදිව දැක්වීම (ලකුණු 02)
- මූල්‍ය ප්‍රවාහ දිසාවක් සමග නිවැරදිව දැක්වීම (ලකුණු 02)

(ii)



(iii) (අ) ඇතුළත් නොවේ නිෂ්පාදන ප්‍රවාහයට අලුතින් කිසිවක් එකතු නොවේ.

(ආ) ඇතුළත් වේ. මූල්‍ය සේවා වල යෙදෙමින් උපයන අදායම

(ඉ) ඇතුළත් නොවේ, කුටුම්බය තුල සාමාජිකයින් විසින් ඉටුකරනු ලබන සේවාවකි.

(ඊ) ඇතුළත්වේ, ඵලදායී ආර්ථික ක්‍රියාවකි. (ලකුණු 1 × 4 = 04)

(iv) (අ)

| | | | |
|---|---|---|---|
| කෘෂි අංශයේ එක-තුකළ අගය | (17000 - 6000) | = | 11000 |
| කාර්මික අංශයේ එක-තුකළ අගය | (24000 - 5000) | = | 19000 |
| සේවා අංශයේ එක-තුකළ අගය | (30000 - 10000) | = | 20000 |
| මූලික මිල අනුව සමස්ථ එකතුකළ අගය | | = | 50000 |
| භාණ්ඩ හා සේවා මත ශුද්ධ බදු | | = | 5000 |
| දළ දේශීය නිෂ්පාදිතය (වෙළඳ මිල අනුව) | | = | 55000 |

(ලකුණු 03)

(ආ)

| | | |
|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | = | 55000 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | = | -3000 |
| දළ ජාතික ආදායම | = | 52000 |

(ලකුණු 02)

(ඉ) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය $= \frac{\text{දළ දේශීය නිෂ්පාදිතය}}{\text{ගම්‍ය මිල දර්ශකය}} \times 100$

$\frac{55000}{112} \times 100$

$49107.14$ (ලකුණු 01)

(ඊ) ශුද්ධ දේශීය නිෂ්පාදිතය = දළ දේශීය නිෂ්පාදිතය -- ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම්

= 55000 - 1000

= 54000 (ලකුණු 01)

(උ) දළ ජාතික ආදායම -+ ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම = උපයෝජ්‍ය දළ ජාතික ආදායම

52000 + 2000 = 54000 (ලකුණු 01)

(8)(i)
- පෞද්ගලික පරිභෝජන වියදම (C)
- රාජ්‍ය මිලදී ගැනීම් (G)
- ආයෝජන වියදම් (I)
- ශුද්ධ අපනයන (X-M) (ලකුණු 1 × 4)

E= C + I + G + (X-M) (පමණක්නම් ලකුණු 02ක්)

(ii) (අ) පරිභෝජන ශ්‍රිතය C= a + byd

b =

a ගණනය කරන්න.

$C = a + 0.8\ y_d$

$2200 = a + 0.8 \times 2500$

$2200 = a + 20000$

$2200 - 2000 = a$

$200 = a$

$C = 200 + 0.8\ y_d$ (ලකුණු 02)

(ආ) $S = y_d - C$

$S = y_d - (200+0.8y_d)$

$S = y_d - 200 - 0.8y_d$

$S = - 200 + 0.2y_d$ (ලකුණු 02)

(ඉ) $S = -200+0.2y_d$

$0 = -200+0.2y_d$

$0.2y_d = -200$

$y_d = \frac{-200}{-2}$

$y_d = 1000$ (ලකුණු 02)

(iii) $C = a - byd$

$C = a + 0.8y_d$

$APC = \frac{C}{y}$

$0.9 = \frac{C}{2000}$

$C = 18000$

(iv) ඇ) $y = E$

$y = C + I$

$y = 200+0.8y_d+200$

$y = 400+0.8y$

$y - 0.8y = 400$

$y = \frac{400}{2}$

$= \underline{2000}$ (ලකුණු 02)

(ඉ) $y = E$

$y = C + I$

$y = 200+0.8y_d+400$

$y = 600+0.8y$

$0.2y = 600$

$y = \frac{600}{2}$ (ලකුණු 02)

$= 3000$

(ඇ) $C = a - 0.8y_d$

$1800 = a + 0.8 \times 2000$

$1800 = a + 1600$

$\underline{200 = a}$

$C = 200 + 0.8y_d$ (ලකුණු 02)

(ඇ) $C = 200 + 0.8 \times 2000$

$C = 200 + 16000$

$\underline{C = 1800}$

$S = -200 + 0.2y$

$S = -200 + 0.2x2000$

$S = 200 + 4000$

$\underline{S = 200}$ (ලකුණු 01)

(ඊ) $y = E$

$y = C + I$

$y = 200+0.8y_d+100$

$y = 300+0.8y$

$0.2y = 300$

$y = \frac{300}{2}$ (ලකුණු 02)

$= 1500$

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440